# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 48 දරන මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1987 දෙසැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 ශ.                    තැපැල් ගාස්තුව : ශත 75 ශ.

# 1987 අංක 48 දරන මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1987 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 6/82

**වෛද්‍ය, විද්‍යාත්මක, අධ්‍යාපනික හෝ පර්යේෂණ කාර්ය සඳහා මනුෂ්‍ය ශරීර සහ පටක ප්‍රදානය කිරීම සඳහා ද එම පටක ඉවත් කර ගැනීම සහ ඒවා ජීවත්වන පුද්ගලයන් මත භාවිතා කිරීම් සඳහා ද එම පටක ආරක්ෂා කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1987 අංක 48 දරන මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදාන.

**2.** වයස අවුරුදු විසිඑකට වැඩි යම් තැනැත්තකු විසින් වෛද්‍ය හෝ දන්ත අධ්‍යාපනයේ දියුණුව සඳහා, පර්යේෂණ කාර්ය සඳහා, වෛද්‍ය විද්‍යාවේ හෝ චිකිත්සාවේ දියුණුව සඳහා හෝ ජීවත් වන තැනැත්තකු මත භාවිතා කිරීම සඳහා හෝ තමාගේ ශරීරය හෝ එහි යම් කොටසක් හෝ යම් පටකයක් තමාගේ මරණයෙන් පසු බලාත්මක වන පරිදි (මෙහි මින් මතු "මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානය" යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රදානය කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කළ හැකි ය.

මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා කැමැත්ත දිය හැක්කේ කෙසේ ද යන වග.

**3.** (1) ප්‍රදානකරු විසින් මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා කැමැත්ත සුදුසු සාක්ෂිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් සහතික කරන ලද ලියවිල්ලක් මගින් හෝ සුදුසු සාක්ෂිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් සහතික කරන ලද නියමිත ආකෘතිය මත හෝ යටත් පිරිසෙයින් සුදුසු සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට වාචිකව හෝ දිය හැකි ය.

(2) ප්‍රදානකරු විසින් මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයේ කාර්යය තම කැමැත්තේ නිශ්චිතව දක්වා නොතිබීමම පමණක් අනෙක් සියලු ආකාරවලින් වලංගු වන මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයක් අවලංගු වීමට තරම් ප්‍රමාණවත් හේතුවක් නොවිය යුතු ය.

**ප්‍රදානලාභීන්.**

4. (1) මරණයෙන් පසු, බලාත්මක වන ප්‍රදානයක්—

(අ) යම් රජයේ ආරෝග්‍යශාලාවකට ;

(ආ) යම් වෛද්‍ය වෘත්තිකයකුට ;

(ඇ) යම් දන්ත වෛද්‍යවරයකුට ; හෝ

(ඈ) යම් නියමිත ආයතනයකට

කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රදානකරු විසින් ප්‍රදානලාභියා නිශ්චිතව දක්වනු ලැබ නොමැති අවස්ථාවක හෝ ප්‍රදානලාභියා සොයා ගනු ලැබිය නොහැකි අවස්ථාවක, ප්‍රදානකරු මියගිය ස්ථානයට ආසන්නතම රජයේ ආරෝග්‍යශාලාව හෝ නියමිත ආයතනය ප්‍රදානලාභියා ලෙස සැලකිය යුතු ය.

මියගිය තැනැත්තකුගේ ශරීරය හෝ එහි යම් කොටසක් හෝ එහි යම් පටකයක් හෝ ඉවත් කර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළ හැකි එකී මියගිය තැනැත්තාගේ ඥාතීන්.

**5.** (1) මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා කැමැත්තක් දී නොමැති යම් තැනැත්තකු මියගිය විට, එකී මියගිය තැනැත්තා ඔහුගේ ජීවිත කාලය තුළ කවර අවස්ථාවක දී හෝ පටහැනි චේතනාවක් ප්‍රකාශ කර නොමැති නම්, 2 වන වගන්තියේ සඳහන් කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා, එම තැනැත්තාගේ ශරීරයේ හෝ ඒ කැමැත්තේ නිශ්චිතව සඳහන් කරනු ලැබ තිබෙන කොටස හෝ පටකය ඉවත් කර ගැනීම පිණිස එකී මියගිය තැනැත්තාගේ වයස විසිඑකට වැඩි ළඟම ඥාතියා විසින් පූර්ව කැමැත්ත ප්‍රකාශ කරනු ලැබීම නිත්‍යානුකූල වන්නේ ය.

(2) යම් ළමයකු මියගිය විට, 2 වන වගන්තියේ සඳහන් කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා, එම ළමයාගේ ශරීරය හෝ කැමැත්ත නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති කොටස හෝ පටකය ඉවත් කර ගැනීම පිණිස, ඒ ළමයාගේ මව්පිය දෙදෙනා විසින් හෝ දෙමව්පියන්ගෙන් එක් කෙනකු නොමැති විට නැතහොත් අබලතාවයකට පත් වී ඇති විට, ඉතිරි තැනැත්තා විසින් හෝ මව්පිය දෙදෙනාම නැති විට ඒ ළමයාගේ භාරකරු විසින් හෝ පූර්ව කැමැත්ත ප්‍රකාශ කරනු ලැබීම නිත්‍යානුකූල වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ දෙන ලද කැමැත්තක ප්‍රදානලාභී කවරකු ද යන වග සඳහන් වන්නේ නම් මිස, ඒ කැමැත්ත වලංගු නොවිය යුතු ය.

(4) මෙ වගන්තිය යටතේ ප්‍රදානලාභීන් වන්නේ 4 වන වගන්තිය යටතේ ප්‍රදානලාභීන් වන තැනැත්තන්ම ය.

මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයන් සඳහා දී ඇති කැමැත්ත ප්‍රදානකරු විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි බව.

**6.** ප්‍රදානකරුවකු විසින්, ඔහුගේ ජීවිත කාලය ඇතුළත ප්‍රදානලාභිගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ කැමැත්ත නොමැතිව, මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා දී ඇති කැමැත්ත සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක්—

(අ) එකී මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානය සඳහා කැමැත්ත දුන් ලියවිල්ලට පසුව ලියනු ලබන ලියවිල්ලක් මගින් ; හෝ

(ආ) එකී මරණයෙන් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා කැමැත්ත නියමිත ආකෘතියක දී ඇති අවස්ථාවක, ප්‍රත්‍යාදිෂ්ට කිරීමට ඔහු අදහස් කරන බව ප්‍රදානලාභිට ලියවිල්ලකින් දැනුම් දීමෙන්

ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

පුනර්වර්ධන නොවන පටක බද්ධ කිරීම සඳහා ජීවිත කාලය තුළ දී ඉවත් කර ගැනීමට ජීවත්ව සිටින වැඩිහිටි තැනැත්තකු විසින් කැමැත්ත දීම.

**7.** (1) 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා තම ශරීරයෙන් (මෙහි මින් මතු "ජීවිත කාලය තුළ ප්‍රදානයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) කැමැත්තේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති පුනර්වර්ධන නොවන පටක, තම ජීවිත කාලය තුළ දී ඉවත් කර ගැනීම සඳහා වයස අවුරුදු විසි එකට වැඩි යම් තැනැත්තකු විසින් තම කැමැත්ත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් ගොනු කර තැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ එවැනි කැමැත්තක් දෙන ලද අවස්ථාවක, එම පුනර්වර්ධන නොවන පටකය ජීවිත කාලය තුළ දී ප්‍රදානය කිරීමට පෙර,—

(අ) එම කැමැත්තේ නිශ්චිතව සඳහන් පටකය එම තැනැත් තාගේ ශරීරයෙන් ජීවිත කාලය තුළ දී ප්‍රදානය කිරීමේ ස්වභාවය සහ ඵල විපාක එම කැමැත්ත දීමට පෙර එම තැනැත්තාට තමා පැහැදිලි කර දුන් බවත් ;

(ආ) එම කැමැත්ත දුන් වේලාවේ දී එම තැනැත්තා—

(i) වයස අවුරුදු විසිඑකට එළඹ සිටි බවත් ;

(ii) හොඳ සිහියෙන් යුක්තව සිටි බවත් ; සහ

(ඇ) එම තැනැත්තා ඔහුගේ කැමැත්ත තමා ඉදිරිපිට ස්වාධීනව දුන් බවත්

එම පටකය පාවිච්චි කිරීමට සූදානම් වන කණ්ඩායමට අයිති වෛද්‍ය උපදේශකවරයකු නොවන වෙනත් වෛද්‍ය උපදේශකවරයකු විසින් ලියවිල්ලකින් සහතික කළ යුතු ය.

(3) වෙනත් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද මේ වගන්තිය යටතේ කැමැත්තක් දී ඇත්තේ යම් පුනර්වර්ධන නොවන පටකයක් සම්බන්ධයෙන් ද එම පටකය යම් නියමිත ශිල්පියකු විසින් ශරීරයෙන් ඉවත් කරනු ලැබීම සහ භාවිතයට සූදානම් කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ තම කැමැත්ත හෙනු කර තැබූ යම් තැනැත්තකු විසින් ජීවිත කාලය තුළ ප්‍රදානය කිරීමට පෙර ඒ කැමැත්ත ලියවිල්ලකින් ඉල්ලා අස්කර ගත හැකි ය.

(5) මේ වගන්තිය යටතේ ප්‍රදානලාභීන් වන්නේ 6 වන වගන් තිය යටතේ ප්‍රදානලාභීන් වන තැනැත්තන්ම ය.

8. (1) යම් ළමයකුගේ දෙමව්පියන් විසින් හෝ දෙමව්පියන් ගෙන් එක් කෙනකු නොමැති විට නැතහොත් අබලතාවකට පත් වී ඇති විට, ඉතිරි තැනැත්තා විසින් හෝ දෙම්පියන් නොමැති විට, ඒ ළමයාගේ භාරකරු විසින් හෝ ඒ ළමයාගේ පවුලේ වෙනත් සාමාජිකයකුගේ ශරීරයට තම කැමැත්තේ සඳහන් කරනු ලබන, පුනර්වර්ධන පටකය බද්ධ කිරීමේ කාර්යය සඳහා ඒ ළමයාගේ ශරීර යෙන් ඒ පුනර්වර්ධන පටකය ජීවිත කාලය තුළ ප්‍රදානය කිරීම පිණිස, තම කැමැත්ත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් හෙනුකර තබනු ලැබිය හැකිය.

පුනර්වර්ධන පටක පිළිබඳ ජීවිත කාලය තුළ ප්‍රදාන.

(2) වයස අවුරුදු විසි එකට වැඩි යම් තැනැත්තකු විසින්, ඒ තැනැත්තාගේ පවුලේ වෙනත් සාමාජිකයකුගේ ශරීරයට තම කැමැත්තේ සඳහන් කරනු ලබන, පුනර්වර්ධන පටකය බද්ධ කිරීමේ කාර්ය සඳහා ඒ තැනැත්තාගේ ශරීරයෙන් ඒ පුනර්වර්ධන පටකය ජීවිත කාලය තුළ ප්‍රදානය කිරීම පිණිස තම කැමැත්ත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් හෙනු කර තබනු ලැබිය හැකි ය.

(3) (1) වන සහ (2) වන උපවගන්ති යටතේ එසේ කැමැත්ත දෙන ලද අවස්ථාවක, ඒ පුනර්වර්ධන පටකය ජීවිත කාලය තුළ ප්‍රදානය කිරීමට පෙර—

(අ) ඒ කැමැත්තේ නිශ්චිතව සඳහන් පටකය, අවස්ථාවෝචිත පරිදි, ඒ ළමයාගේ හෝ තැනැත්තාගේ ශරීරයෙන් ජීවිත කාලය තුළ දී ප්‍රදානය කිරීමේ ස්වභාවය සහ විපාක එම කැමැත්ත ප්‍රකාශ කිරීමට පෙර, අවස්ථාවෝචිත පරිදි, එම දෙමව්පියන්ට, භාරකරුට හෝ තැනැත්තාට තමා පැහැදිලි කර දුන් බව ; සහ

(ආ) ඒ තැනැත්තා ඔහුගේ කැමැත්ත තමා ඉදිරියේ දී ස්වාධීනව දුන් බව

එම පටකය පාවිච්චි කිරීමට සූදානම් වන කණ්ඩායමට අයත් වෛද්‍ය උපදේශකවරයකු නොවන වෙනත් වෛද්‍ය උපදේශකවරයකු විසින් ලියවිල්ලකින් සහතික කළ යුතු ය.

(4) වෙනත් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, මේ වගන්තිය යටතේ කැමැත්ත දී ඇත්තේ යම් පුනර්වර්ධන පටකයක් සම්බන්ධයෙන් ද ඒ පටකය යම් නියමිත ශිල්පියකු විසින් ශරීරයෙන් ඉවත් කරනු ලැබීම සහ භාවිතයට සූදානම් කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(5) යම් දෙමව්පියන් විසින් හෝ භාරකරුවකු විසින් හෝ තැනැත්තකු විසින් (1) සහ (2) වන උපවගන්ති යටතේ තම කැමැත්ත ගොනු කරනු ලැබූ අවස්ථාවක, ඕනෑම වේලාවක ජීවිත කාලය තුළ ප්‍රදානය කිරීමට පෙර ඔහු විසින් ඒ කැමැත්ත ලියවිල්ල කින් ඉල්ලා අස් කර ගත හැකි ය.

(6) මේ වගන්තිය යටතේ ප්‍රදානලාභීන් වන්නේ 4 වන වගන්තිය යටතේ ප්‍රදානලාභීන් වන තැනැත්තන්ම ය.

**මියගිය තැනැත්තකුගේ ශරීරය හෝ එහි යම් කොටසක් හෝ පටකයක් ඉවත් කර ගැනීමේ බලය.**

9. (1) මරණින් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා කැමැත්ත දී ඇති තැනැත්තකු මියගිය අවස්ථාවක, ඒ ශරීරය භූමදාන කිරීමේ හෝ ආදාහනය කිරීමේ කාර්ය සඳහා හෝ එසේ භූමදානය කිරීමට හෝ ආදාහනය කිරීමට ආනුෂංගික යම් කාර්යයක් සඳහා හෝ පමණක් ඒ ශරීරය භාර දෙන ලද යම් තැනැත්තකු හැර, එම මිය ගිය තැනැත්තාගේ ළඟම ඥාතියා විසින් හෝ එම මෘත ශරීරයේ නීත්‍යනුකූල සන්තකය දරන වෙනත් තැනැත්තකු විසින් එසේ මරණින් පසු බලාත්මක වන ප්‍රදානය සඳහා දී ඇති කැමැත්ත 6 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි තදනන්තරව ප්‍රත්‍යාදිෂ්ට කර ඇති බව විශ්වාස කිරීමට, අවස්ථාවෝචිත පරිදි, ඒ ළඟම ඥාතියාට හෝ මෘත ශරීරයේ නීත්‍යනුකූල සන්තකය දරන

තැනැත්තාට හේතු තිබේ නම් මිස, ඒ ශරීරය හෝ ඒ කැමැත්තේ නිශ්චිතව සඳහන් කරන ලද කොටස හෝ පටක ඉවත් කර ගැනීමට, ප්‍රදානලාභියාට බලය දෙනු ලැබිය හැකි ය. ඊට පසුව, 2 වන වගන්තියේ සඳහන් කාර්ය අතුරින් යම් කාර්යයක් ඒ කැමැත්තේ නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක, ඒ වගන්තියේ සඳහන් යම් කාර්යයක් සඳහා අවස්ථාවෝචිත පරිදි, ඒ ශරීරය හෝ ඒ කොටස හෝ ඒ පටකය පාවිච්චි කිරීම පිණිස ඒ ප්‍රදානලාභියාට අයිතිවාසිකම තිබෙන්නේ ය.

(2) ඒ තැනැත්තාගේ මරණය වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කරනු ලැබූ පසු, යම් නියමිත ශිල්පියකු විසින් ඒ කොටස හෝ පටකය ශරීරයෙන් ඉවත් කිරීම හා භාවිතයට සූදානම් කිරීම කරනු ලැබිය හැකි ය.

ආරෝග්‍යශාලාවක දී මිය යන තැනැත්තකුගේ ශරීරය හෝ මිය යාමෙන් පසු ආරෝග්‍යශාලාවකට ගෙන එනු ලැබූ තැනැත්තකුගේ ශරීරය හෝ එහි යම් කොටසක් හෝ පටකයක් ඉවත් කර ගැනීමේ බලය.

10. (1) යම් ආරෝග්‍යශාලාවක දී මියගිය යම් තැනැත්තකු හෝ මියයාමෙන් පසු ආරෝග්‍යශාලාවට ගෙන එනු ලැබූ යම් තැනැත්තකු—

(අ) මරණින් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා කැමැත්ත දී ඇති බව ; සහ

(ආ) 6 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඒ කැමැත්ත ප්‍රත්‍යාදිෂ්ට කර නොමැති බව

අවස්ථාගත කරුණු අනුව සාධාරණ විය හැකි විමර්ශන පැවැත්වීමෙන් පසු, එම ආරෝග්‍යශාලාවේ නියමිත නිලධරයාට පෙනී ගිය අවස්ථාවක, ඒ තැනැත්තාගේ ශරීරය හෝ එම කැමැත්තේ නිශ්චිතව සඳහන් එම කොටස හෝ පටකය ඉවත් කර ගැනීමට මේ වගන්තියේ කාර්ය සඳහා වූ ආකෘතිය මගින් ඒ නියමිත නිලධරයා විසින් ප්‍රදානලාභියාට බලය දෙනු ලැබිය හැකි ය.

(2) ඒ තැනැත්තාගේ මරණය වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කරනු ලැබූ පසු, යම් නියමිත ශිල්පියකු විසින් ඒ ශරීරයෙන් ඒ කොටස හෝ පටකය ඉවත් කිරීම හා භාවිතයට සූදානම් කිරීම කරනු ලැබිය හැකි ය.

බන්ධනාගාරයක් තුළ මියගිය සිරකරුවකුගේ ශරීරය, එහි යම් කොටසක් හෝ එහි පටකයක් ඉවත් කර ගැනීමේ බලය.

11. (1) යම් බන්ධනාගාරයක දී මියගිය යම් සිරකරුවකු—

(අ) මරණින් පසු බලාත්මක වන ප්‍රදානයක් සඳහා කැමැත්ත දී ඇති බව ; සහ

(ආ) 6 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි එම කැමැත්ත ප්‍රත්‍යාදිෂ්ට කර නොමැති බව

අවස්ථාගත කරුණු අනුව සාධාරණ විය හැකි විමර්ශන පැවැත්වීමෙන් පසු, ඒ බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරීවරයාට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකුට පෙනී ගිය අවස්ථාවක ඒ සිරකරුවාගේ ශරීරය ඒ සිරකරුවාගේ භාරකරු විසින් ඉල්ලනු ලැබ තිබේ නම්, ඒ භාරකරුගේ කැමැත්ත ඇතිව සහ ඒ මරණය සම්බන්ධයෙන් පවත්වනු ලබන

මහෙස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසුව, ඒ සිරකරුවාගේ ශරීරය හෝ ඒ කැමැත්තේ සඳහන් කොටස හෝ පටකය ඉවත් කර ගැනීමට ඒ අධිකාරිවරයා හෝ ඒ වෙනත් නිලධරයා විසින් ප්‍රදානලාභියාට ලියවිල්ලකින් බලය දෙනු ලැබිය හැකි ය.

(2) ඒ තැනැත්තාගේ මරණය වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කරනු ලැබූ පසු යම් නියමිත ශිල්පියකු විසින් ඒ කොටස හෝ පටකය ශරීරයෙන් ඉවත් කිරීම හා භාවිතයට සුදුනම් කිරීම කරනු ලැබිය හැකි ය.

හිමිකම් නොපාන ලද ශරීර පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා හා ව්‍යවච්ඡේදක පර්යේෂණ සඳහා ඉවත් කර ගැනීමට අවසර දීමේ බලය.

12. මරණයෙන් පසු දින හතකට වැඩි කාලයක් යම් ශරීරයක් හිමිකම් පානු නොලැබ යම් ආරෝග්‍යශාලාවක හෝ වෙනත් ආයතනයක තිබෙන අවස්ථාවක, ඒ ශරීරය යම් පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වීම පිණිස ඉවත් කර ගෙන යාම සඳහා සහ ඉන් පසුව, යම් ව්‍යවච්ඡේදක පර්යේෂණයක් පැවැත්වීම පිණිස යම් නියමිත ආයතනයක් විසින් ඉවත් කරගෙන යාම සඳහා එම ආරෝග්‍යශාලාවේ හෝ වෙනත් ආයතනයේ නියමිත බලධරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය.

යම් මනුෂ්‍ය ශරීරයක් හෝ එහි යම් කොටසක් හෝ පටකයක්, එය ප්‍රදානය කරන ලැබූ කාර්ය නොවන වෙනත් කාර්යයක් සඳහා භාවිත නොකළ යුතු බව.

13. මේ පනත යටතේ ප්‍රදානය කරන ලද යම් ශරීරයක් හෝ එහි යම් කොටසක් හෝ පටකයක්—

(අ) ප්‍රදානයේ අරමුණ කැමැත්තේ නිශ්චිතව සඳහන් කර ඇති අවස්ථාවක, ඒ කැමැත්තේ ; හෝ

(ආ) අරමුණක් කැමැත්තේ නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක, 2 වන වගන්තියේ

නිශ්චිතව සඳහන් අරමුණක් නොවන වෙනත් අරමුණක් සඳහා භාවිතා කරන යම් තැනැත්තෙක් ඉන් වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට හා එක් අවුරුදු කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

පටක ආරක්ෂා කිරීම.

14. මේ පනත යටතේ ශරීරයකින් පටකයක් ඉවත් කරනු ලැබූ අවස්ථාවක, එය නිසි ලෙස බද්ධ කරනු ලබන තුරු, කලින් කල නියමිත වන ස්ථානයක එසේ නියමිත වන තත්ත්වයන් යටතේ එය ආරක්ෂා කර තැබීම එය ශරීරයෙන් ඉවත් කරන නියමිත ශිල්පියාගේ කාර්යය වන්නේ ය :

එසේ වුව ද, යම් පටකයක් ශරීරයෙන් ඉවත් කර ගැනීම සහ එය බද්ධ කිරීම, එය එවැනි ආරක්ෂක ස්ථානයකට නොයවා, වහාම කළ යුතු බව ඒ බද්ධ කිරීම කරන වෛද්‍ය වෘත්තිකයාගේ අදහස වන අවස්ථාවක දී මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

මරණය යන් නෙහි අර්ථය.

**15.** (1) යම් තැනැත්තකුගේ මොලයෙහි සියලු ක්‍රියා අප්‍රතිවර්ත්‍ය ලෙස නැවතීම, මේ පනතේ කාර්ය සඳහා, ඒ තැනැත්තාගේ මරණය සිදු වීම වන්නේ ය.

(2) ස්වයංසිද්ධ රුධිර සංසරණමය සහ ආශ්වාස-ප්‍රශ්වාසමය ක්‍රියා දීර්ඝ කාලයක් නැවතී තිබෙන විටක මොලයෙහි ක්‍රියා අප්‍රතිවර්ත්‍ය ලෙස නැවතී ඇති ලෙස තීරණය කරනු ලැබිය හැකි ය.

(3) ස්වයංසිද්ධ රුධිර සංසරණමය සහ ආශ්වාස-ප්‍රශ්වාසමය ක්‍රියා දීර්ඝ කාලයක් නැවතී තිබෙන බව කෘත්‍රිම ආධාරක ක්‍රම භාවිතා කිරීමෙන් තීරණය කළ නොහැකි වන අවස්ථාවල, මොලයේ ක්‍රියාවල අප්‍රතිවර්ත්‍ය ලෙස නැවතී තිබෙන බව තත් කාලයේ පිළිගත් වෛද්‍ය පරිචයේ සාමාන්‍ය ප්‍රමිති මගින් නිශ්චය කළ යුතු ය.

මරණය සහතික කරන වෛද්‍ය වෘත්තිකයා බද්ධ කිරීමේ කටයුතුවලට සහභාගි නොවිය යුතු බව.

**16.** (1) යම් තැනැත්තකුගේ මරණය සහතික කර ඇති යම් වෛද්‍ය වෘත්තිකයකු එම තැනැත්තාගේ ශරීරයේ යම් පටකයක් හෝ යම් කොටසක් බද්ධ කිරීමේ කටයුතුවලට සහභාගි නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් වෛද්‍ය වෘත්තිකයකු ඉන් වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, එක් අවුරුදු කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) කුණිත බද්ධ කිරීමේ කටයුතුවලට සහභාගි වන යම් වෛද්‍ය වෘත්තිකයකුට මේ වගන්තියේ අඩංගු කිසිවක් කවර හෝ ආකාරයකින් බල නොපෑ යුතු ය.

ශරීරයක් හෝ එහි යම් කොටසක් හෝ පටකයක් විකිණීම හෝ ඒ සම්බන්ධයෙන් ගණුදෙනුවක් කිරීම හෝ තහනම් බව.

**17.** (1) යම් ශරීරයක් හෝ එහි යම් පටකයක් හෝ කොටසක්, අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව 2 වන වගන්තියේ සඳහන් කාර්යවලින් යමක් සඳහා කෙළින් ම හෝ නොඑසේව, වටිනා ප්‍රතිෂ්ඨාවකට මිලට ගැනීම, විකිණීම හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් ආකාරයකින් ගණුදෙනුවක් කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) එවැනි යම් ශරීරයක්, පටකයක් හෝ කොටසක් ලබා ගැනීමට, ගබඩා කිරීමට සහ බද්ධ කිරීමට ප්‍රමාණවත් පහසුකම් ඒ තැනැත්තාට ඇති බවටත් ඒ ශරීරය, පටකය හෝ කොටස ඒ තැනැත්තා විසින් මේ පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කාර්යවලින් යම් කාර්යයක් සඳහා පමණක් පාවිච්චි කරනු ලබන බවටත් අමාත්‍යවරයා සෑහීමට පත් වුවහොත් මිස අමාත්‍යවරයා විසින් ඒ අනුමතය නොදිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු ඉන් වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක්

ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

තොරතුරු අනාවරණය කිරීම.

**18.** (1) (අ) මේ පනත යටතේ කැමැත්තක් දුන් හෝ කැමැත්තක් දීම ප්‍රතික්ෂේප කළ යම් තැනැත්තකුගේ ; හෝ

(ආ) මේ පනත යටතේ කැමැත්තක් දෙනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ ; හෝ

(ඇ) යම් පටකයක් බද්ධ කරනු ලැබුවේ, ලබමින් පවතින්නේ හෝ කළ හැකිවන්නේ යම් තැනැත්තකුගේ ශරීරයට ද ඒ තැනැත්තාගේ

අනන්‍යතාවය එළිදරව් විය හැකි යම් තොරතුරක් හෝ ලේඛනයක් නවත් තැනැත්තකුට අනාවරණය කරන ලෙස හෝ දෙන ලෙස නීතියෙන් නියම කර ඇති අවස්ථාවක හැර, කිසිම තැනැත්තකු විසින් එසේ එවැනි තොරතුරක් හෝ ලේඛනයක් අනාවරණය කිරීම හෝ දීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු ඉන් වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

මරණ පරීක්ෂණවලට මේ පනතේ කිසිවක් අදාළ නොවිය යුතු බව.

**19.** යම් තැනැත්තකුගේ මරණයට හේතුව සනාථ කිරීමේ හෝ ස්ථිර කිරීමේ කාර්යය සඳහා හෝ ඒ මරණයට අසාමාන්‍ය හේතු තුඩු දී තිබේදැයි හෝ ඒ හේතුවල ස්වභාවය කවරේදැයි විමර්ශනය කිරීමේ කාර්යය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ මරණ පරීක්ෂකයකු විසින් පවත්වනු ලබන යම් මරණ පරීක්ෂණයකට මේ පනතේ අඩංගු කිසිවක් අදාළ නොවිය යුතු ය.

උපදේශක සභාව.

**20.** (1) මනුෂ්‍ය පටක බද්ධ කිරීම පිළිබඳ උපදේශක සභාව යනුවෙන් හැඳින්විය යුතු වූ ද (මෙහි මින්මතු " සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද) පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වූ ද සභාවක් තිබිය යුතු ය:—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ශල්‍ය වෛද්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍ය උපදේශකවරයන් සහ සාමාන්‍ය වෛද්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍යවරයන් (මේ සාමාජිකයන් මෙහි මින්මතු " පත්කළ සාමාජිකයන් " යනුවෙන් හඳුන්වනු ලැබේ.) ;

(ආ) ඉහත දැක්වෙන ධුර තත් කාලයේ දරන (මෙහි මින්මතු "නිල බලයෙන් පත් වූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) තවත් සාමාජිකයන් පස් දෙනෙක් :—

(i) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ; ඔහු සභාවේ සභාපතිවරයා විය යුතු ය ;

(ii) ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරයා ;

(iii) නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා (රසායනාගාර සේවා), ඔහු සභාවේ ලේකම්වරයා විය යුතු ය ;

(iv) කොළඹ අධිකරණ වෛද්‍ය නිලධරයා ; සහ

(v) සමාන ස්වභාවයක කාර්යයක නිරත වී සිටින වෙනත් යම් වෛද්‍ය නිලධරයෙක්.

(2) මරණය නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ඉවත් කරනු ලැබීම නිසා හෝ කලින් ධුරය හිස් වුවහොත් මිස, සෑම පත්කළ සාමාජිකයකුම අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) යම් පත්කළ සාමාජිකයකු කිසිම හේතුවක් නොදක්වා ධුර යෙන් ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම් අමාත්‍යවරයා විසින් එසේ කළ හැකි ය.

(4) තමා ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වමින් අමාත්‍යවරයා වෙත අමතන ලද ලිපියක් මගින්, යම් පත්කළ සාමාජිකයකුට කවර හෝ අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) පත්කළ සාමාජිකයකු මියගියහොත්, ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට සාමාජිකයකු වශයෙන් වෙනත් තැනැත් තකු පත් කළ හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ඔහු විසින් ධුරය දැරිය යුතු ය.

(7) ඉවත් කරනු ලැබීමෙන් හැර වෙනත් ආකාරයකින් ධුරය හිස් කරන යම් පත්කළ සාමාජිකයෙක්, (2) වන උපවගන්තියේ සඳහන් අවුරුදු තුනක් වූ කාලසීමාව ඉකුත් වූ විට, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(8) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(9) සභාවේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද එවැනි රැස්වීම්වල දී කරනු ලැබිය යුතු කටයුතු ද සභාව විසින් විධිමත් කරගත යුතු ය.

(10) සභාවේ පුරප්පාඩුවක් තිබීමේ හෝ සභාවේ යම් සාමාජික යකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වී ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

සභාවේ කාර්යය.

**21.** මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ කටයුතු පරිපාලනයේ දී හෝ මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සභාවේ කාර්යය විය යුතු ය.

නියෝග.

**22.** (1) නියමිත කරුණු ලෙස මේ පනතේ නියම කර ඇති සියලු කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය යුතු කරුණු ලෙස මේ පනතින් නියම කර ඇති හෝ බලය දෙන ලද සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් එසේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ ඒ නියෝගය පළ කරනු ලබන දිනයෙහි සිට හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් පසු දිනයක සිට හෝ ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් එසේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු අනුමතය සඳහා හැකි තාක් ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ දිනය ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**23.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ළමයා" යන්නෙන් වයස අවුරුදු විසි එකට අඩු තැනැත්තෙක් අදහස් වේ;

"සුදුසු සාක්ෂිකරු" යන්නෙන් වයස අවුරුදු දහඅටට නොඅඩු සාක්ෂිකරුවෙක් අදහස් වේ;

"දන්ත වෛද්‍යවරයා" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"වෛද්‍ය උපදේශක" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබූ සහ නියමිත පශ්චාත් උපාධි සුදුසුකම්වලින් යම් සුදුසුකමක් ඇති තැනැත්තෙක් අදහස් වේ;

"වෛද්‍ය වෘත්තිකයා" යන්නෙන් වෛද්‍ය ආඥාපනත යටතේ වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"පුනර්වර්ධන නොවන පටකය" යන්නෙන් පුනර්වර්ධනු පටක යක් නොවන පටකයක් අදහස් වේ;

"බන්ධනාගාරය" යන්නෙහි, බන්ධනාගාර ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත;

"පුනර්වර්ධන පටකය" යන්නෙන් තුවාලවීමකින් හෝ ඉවත් කරනු ලැබීමෙන් පසු වැඩීමේ හෝ අළුත්වැඩියා වීමේ ස්වාභාවික ක්‍රියාවලියක් මගින්, ජීවත්වන තැනැත්තකු ගේ ශරීරයේ නැවත ඇතිවන පටකයක් අදහස් වේ;

"පටකය" යන්නෙන් යම් මනුෂ්‍ය මාංශයක්, ඉන්ද්‍රියයක්, අස්ථියක් හෝ ශරීර ද්‍රව්‍යයක් හෝ එහි යම් කොටසක් හෝ අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 10 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.